# ලංකා ගුවන් විදුලි සේවය හා සිරස

මේ ලිපි පෙළේ සන්ධිස්ථානයකට අපි දැන් පැමිණ සිටින්නෙමු. අපට දැන් චින්තනය හා සංස්කෘතිය යන වචන තරමක් පුරුදු ය. සාමාන්‍ය ව්‍යවහාරයේ දී සංස්කෘතිය යන්න යොදා ගන්නවාට වැඩි පුළුල් අර්ථයකින් අපි සංස්කෘතිය යන්න යොදා ගනිමු. එසේ ම චින්තනය යන්න ගැන ද අපට යම් වැටහීමක් ඇත. චින්තනය යන්න අප යොදා ගන්නේ සිතීම යන අරුතින් නොවේ. යම් සංස්කෘතියක ජීවත්වන ජනතාවගේ මානසික ව කෙරෙන සියළු කටයුතු එකට බැඳ තබන්නේ චින්තනය විසින් යැයි අපි කීවෙමු. සංස්කෘතියක පදනමෙහි චින්තනය වෙයි. සංස්කෘතියක් යනු ද මිනිසුන් විසින් නිර්මාණය කෙරෙන්නෙකි. සංස්කෘතියෙහි ආරම්භය කවදා කෙසේ ඇති විණි දැයි කීමට හෝ සෙවීමට හෝ අප උත්සාහ නොගත්ත ද, සංස්කෘතියක් පරම්පරාවෙන් පරම්පරාවට උරුම කෙරෙන බව පැහැදිලි ය. සංස්කෘතිය යනු කැවුම් කිරිබත් පොල්තෙල් පහන ආදිය පමණක් නොව ඇඳුම් පැළඳුම්, නැටුම් ගැයුම්, කලා ශිල්ප, ආගමික කටයුතු, විද්‍යාවන් ද ඇතුළු දැනුම, ආචාර ධර්ම, කෙළි සෙල්ලම්, භාෂාව, වෙදකම, ඉංජිනේරු ශිල්පය ආදී සියල්ල වෙයි. යම් පුද්ගලයකු ජෛවීය ව හෝ සාංසාරික ව හෝ උරුම කර නොගන්නාවූ දෑ උරුම කර ගන්නේ සංස්කෘතික ව ය.

මෙයින් කියැවෙන්නේ සංස්කෘතිය යනු ස්ථිතික දෙයක් බවවත් ඉහත සඳහන් දෑ යම්කිසි සංස්කෘතික පසුබිමක සිදුවන බවවත් නොවේ. බටහිර විද්‍යාවට අනුව ශබ්දය ගමන් කරන්නේ පසුබිමේ ඇති යම්කිසි මාධ්‍යයක ය. සාපේක්ෂතාවාදයට පෙර පැවති බටහිර භෞතික විද්‍යාවට අනුව ආලෝකය ද ගමන් කෙළේ යම්කිසි පසුබිම් මාධ්‍යයක ය. මෙයට බටහිර භෞතික විද්‍යාඥයෝ ඊතරය යැයි කීවෝ ය. අයින්ස්ටයින් විද්වතා ඊතරය බටහිර භෞතික විද්‍යාවෙන් පළවා හැරියේ ය. සංස්කෘතිය යනු නැටුම් ගැයුම්, දැනුම, කලා ශිල්ප ආදිය ක්‍රියාත්මක වන එවැනි පසුබිම් මාධ්‍යයක් නොවේ. ඒ සියල්ල සංස්කෘතියෙහි විවිධ අංග වෙයි. මේ විවිධ අංග එකට බැඳ තබන්නේ, ඒ සියල්ල පදනම් වන්නේ චින්තනයෙහි ය.

සංස්කෘතිය ද වෙනස් වෙයි. සංස්කෘතීන් යනු මිනිසුන්ගේ නිර්මාණ වෙයි. එහෙත් කලින් සඳහන් කර ඇති අන්දමට මිනිසුන් ක්‍රියා කරන්නේ සංස්කෘතීන් තුළ ය. මේ චක්‍රීය සම්බන්ධයකි. මිනිසුන් සැම විට ම ක්‍රියා කරන්නේ දෙන ලද සංස්කෘතියක නම් ඒ සංස්කෘතිය වෙනස් වීමට ඉඩක් නැත. මිනිසුන් දෙන ලද සංස්කෘතියක, එනම් යම් සංස්කෘතියක, ක්‍රියා කරන්නේය යන්නෙහි තේරුම ඕනෑම පරම්පරාවක් තමන්ට වැඩිහිටි පරම්පරාවෙන් ලැබුණු දේ එලෙස ම අනුගමනය කරන්නේ ය යන්න ය. එහෙත් ඉන් එවැනි සංස්කෘතියක කිසිම නව නිර්මාණයක් නොකෙරෙන්නේ ය යන්න ගම්‍ය නොවේ. නව පරම්පරාව නව කවි නිර්මාණය කරයි. එසේත් නැත්නම් නව කලා නිර්මාණ කරයි. එහෙත් ඒ නව කවි පැරණි විරිත්වලින් ම බැඳුනේ වෙයි. කලා නිර්මාණ පැරණි අච්චුවේ ම නිර්මාණය වෙයි. එහි මූලික වෙනසක් නැත. සාමාන්‍යයෙන් මිනිසුන් නිර්මාණ කරන්නේ යම් සංස්කෘතියක් තුළ ය. ඒ අරුතින් ගත්කල නිර්මාණ නොකරන්නන් පමණක් නොව ඉහත කී අන්දමින් නිර්මාණ කරන්නෝ ද සංස්කෘතියක් විසින් මෙහෙයවෙති.

සංස්කෘතීන්වල විවිධ මිනිස්සු උපත ලබති. එක් සංස්කෘතියක ජීවත්වන්නවුන් අතර සාංසාරික ව උරුම කර ගන්නා වූ වෙනස්කම් වෙයි. ඇතැම්හු වඩා නිර්මාණශීලී වෙති. මේ නිර්මාණශීලීත්වය ඇතැම් විට සංස්කෘතියෙන් උරුම කර දෙන අච්චුව ඉක්මවා යයි. ඔවුහු වෙනත් අච්චු නිර්මාණය කර ඒ නව අච්චුවල නව නිර්මාණ කරති. මෙවැන්නන්ගේ නිර්මාණශීලීත්වය කලින් සඳහන් කරන ලද, දෙන ලද අච්චුවක නිර්මාණය කරන්නන්ගේ නිර්මාණශීලීත්වයට වඩා වැඩි වෙයි. මෙවැන්නෝ තම නිර්මාණ තුළින් තමන් ට උරුම වූ සංස්කෘතිය ද යම් ප්‍රමාණයකට වෙනස් කිරීමට දැනුවත් ව හෝ නොදැනුවත් ව හෝ (සවිඥානික ව හෝ අවිඥානික ව හෝ) උත්සාහ කරති. ඒ උත්සාහය හුදු උත්සාහයක් පමණක් නොව වෙනස් කිරීමක් බවට පත්වන්නේ අදාළ සංස්කෘතිය ඒ නව නිර්මාණය පිළිගන්නේ නම් පමණකි. එනම් මුළු මහත් සමාජයේ යම් තීරණාත්මක පිරිසක් (කිහිප දෙනකු නොව) ඒ නිර්මාණය පිළිගන්නේ නම් ය. සිංහල කවියට, සිංහල සමාජය විසින් ඉහත අර්ථයෙන් පිළිගැනෙන පරිදි, නව විරිතක් හඳුන්වාදෙන්නකු එම නිර්මාණය මගින් ඉතා සුළු වශයෙන් වුව ද සංස්කෘතිය වෙනස් කරන්නේ යැයි කිව හැකි ය. එයට හේතුව ඒ පුද්ගලයා සිංහල කවිය වෙනස් කරන බැවිනි ; සිංහල කවියට නව මානයක් එකතු කරන බැවිනි. ඇතැමුන් මේ

© Prof. Nalin De Silva

අර්ථකථනය සමග එකඟ නොවනවා විය හැකි ය. ඇතැමුන්ට අනුව එවැනි දෙයකින් පවා සංස්කෘතිය වෙනස් නොවනවා විය හැකි ය. එය එතරම් ගැටළුවක් නොවේ. මෙහි සඳහන් දේ තවත් වර්ධනය විය යුතු ය. මා මෙහි දී ඉදිරිපත් කරන්නේ වෙනස් කිරීම හා වෙනස් වීම පිළිබඳ ඉතා දළ අදහසක් පමණකි.

ඉහත කී අයුරින් සංස්කෘතිය වෙනස් කරන පුද්ගලයකු වුව ද බොහෝ විට චින්තනය වෙනස් නොකරයි. එක් චින්තනයක් තුළ සුළු සුළු වශයෙන් වෙනස්කම් ඇති සංස්කෘතීන් තිබිය හැකි ය. සංස්කෘතියක පදනමෙහි චින්තනයක් ඇත යන්නෙන් සංස්කෘතීන් හා චින්තන අතර එකට එක අනුරූපිතයක් (one to one correspondence) ඇති බවක්, එනම් එක් සංස්කෘතියකට එක් චින්තනයක් පමණක් හා එක් චින්තනයකට එක් සංස්කෘතියක් පමණක් අනුරූප වන බවක්, ගැට ගැසෙන බවක්, ගම්‍ය නොවේ. සංස්කෘතීන් කිහිපයක් එක් චින්තනයක් මත පදනම් විය හැකි ය. එහෙත් චින්තන කිහිපයක් එක් සංස්කෘතියක් මත පදනම් නොවන බව ද අමතක නොකළ යුතු ය. සංස්කෘතියක් වෙනස් කිරීමට වඩා චින්තනයක් වෙනස් කිරීම අමාරු කාර්යයකි.

සංස්කෘතියක් යනු නැටුම් ගැයුම්, කලා ශිල්ප, දැනුම ආදියෙහි එකතුව යැයි සඳහන් කෙරී ඇත. කලා ශිල්පවල යම් වෙනසක් වී නැටුම් ගැයුම්වල වෙනසක් නොවී තිබිය හැකි ය. එවැනි අවස්ථාවක චින්තනය වෙනස් නොවෙයි. චින්තනයෙහි වෙනසක් වූ විට සංස්කෘතියෙහි එක් අංගයක පමණක් නොව අංග රාශියක වෙනස්කම් සිදු වෙයි. චින්තනයක් වෙනස් කිරීම සංස්කෘතියක් වෙනස් කිරීමට වඩා මූලික කාර්යයක් වන්නේ එබැවිනි. යම්කිසි පුද්ගලයකු චින්තනයක් වෙනස් කිරීමට දැනුවත් ව හෝ නොදැනුවත් ව හෝ උත්සාහ කිරීමෙන් පමණක් චින්තනයක් වෙනස් නොවේ. සංස්කෘතික වෙනසක දී මෙන් ම චින්තනයෙහි ද වෙනසක් වන්නේ අදාළ සමාජය, එනම් එහි තීරණාත්මක පුද්ගලයන් යම් ප්‍රමාණයක්, ඒ වෙනස පිළිගන්නේ නම් පමණකි. සමාජයක කිහිප දෙනකු කෙතරම් බලගත් වුව ද ඔවුන්ට චින්තනයක් වෙනස් කිරීමට හැකි යැයි සිතීම මුළාවකි.

මේ වෙනස්වීම් හා වෙනස්කිරීම් මෙයට වඩා සරල මට්ටමක උදාහරණවලින් තේරුම් ගත හැකි ය. ඇතැම් ගීත, චිත්‍රපටි ආදිය ඉතා ඉක්මණින් ජනප්‍රිය වෙයි. බොහෝ විට ඒ ජනප්‍රියතාවය තාවකාලික වුවක් විය හැකි ය. ඇතැම් ගීත, චිත්‍රපටි කෙසේවත් ජනප්‍රිය නොවෙයි. ඇතැම් ගීතයක් කලක් ගතවීමෙන් පසුව ජනප්‍රිය විය හැකි ය. මෙහි දී සිදු වන්නේ කුමක් ද? ගීත චිත්‍රපටි ආදිය ජනප්‍රිය වන්නේ ඒවා කලාත්මක වීම හෝ වෙනත් අයුරකින් "හොඳ" වීම නිසා නොවේ. කලාත්මක බව ආදිය සාපේක්ෂ ගුණ වෙයි. යම් සමාජ තලයක යම් ගීතයක් ජනප්‍රිය වන්නේ එහි අරුත, තනුව, ගායකයාගේ හෝ ගායිකාවගේ හෝ ගායන විලාශය ආදී කරුණු රාශියක් මුල් කරගෙන ය. අමරදේව මහතාගේ ගීත ජනප්‍රිය වන්නේ සිංහල සමාජයෙහි ම එක් තලයක ය. උත්තර භාරතීය රාගධාරී සංගීතය හොඳින් දත් අය අමරදේව මහතා දක්ෂයකු ලෙස නොපිළිගනිති. ඔහු එවැන්නන් අතර ජනප්‍රිය නොවෙයි. එමෙන් ම සාමාන්‍යයෙන් ගතහොත් ජෝතිපාල මහතාගේ ගීත ප්‍රිය කරන සමාජ තලයෙහි ද අමරදේව මහතා ජනප්‍රිය නොවෙයි. අමරදේව මහතා ජනප්‍රිය වන්නේ එතරම් ඉහළට උත්තර භාරතීය රාගධාරී සංගීතය නොහැදෑරූ සාමාන්‍යයෙන් සරල සංගීතයට ප්‍රිය කරන එහෙත් සමාජයේ යම් ප්‍රබුද්ධත්වයක් ඇතැයි පිළිගැනෙන පුද්ගලයන් (රසිකයන්) අතර ය. ඇතැමුන් අමරදේව මහතාගේ ගීත ප්‍රියකරන්නන්  ප්‍රබුද්ධ සංස්කෘතියකට අයත් යැයි සලකන බව පෙනෙයි. මොවුන්ට අනුව ජෝතිපාල මහතාගේ ගීත ප්‍රිය කරන්නෝ ජනප්‍රිය සංස්කෘතියකට අයත් වෙති. මේ ජනප්‍රිය සංස්කෘති කතාව අනුකාරකයන් විසින් ඉංගිරිසියෙන් ඇති බටහිර සංකල්ප සිංහලට පරිවර්තනය කරනු ලැබීමෙන් නිර්මාණය කරගත් එකකි. බටහිර අනුකරණය කරමින් ජනප්‍රිය හා විදග්ධ යනුවෙන් බෙදිය හැකි සංස්කෘතික ධාරාවන් සිංහල සංස්කෘතියෙහි නැත. අමරදේව මහතාගේ ගීත ද ඊනියා ජනප්‍රිය සංස්කෘතියට ම අයත් වෙයි.

මේ ජනප්‍රියතාවයෙහි පදනම අපි විභාග කර බලමු. අපට වැරදුනු තැන් ප්‍රදර්ශනය කරන සංකේතයක් ලෙස අමරදේව මහතාගේ ඊනියා ප්‍රබුද්ධ ගීත සඳහන් කළ හැකි ය. අමරදේව මහතාගේ ගීත එක් සමාජ තලයක පමණක් ජනප්‍රිය වන්නේ ඇයි? එයට පිළිතුර ඉතා සරල ය. එසේ ජනප්‍රිය වන්නේ එවැනි ගීත ප්‍රිය කළ හැකි සමාජ තලයක් පසුගිය වසර හැත්තෑපහක පමණ කාලයක් තුළ මෙරට බිහි කෙරී ඇති බැවිනි. එනම් අමරදේව මහතාගේ ගීත පිළිගන්නා සමාජ තලයක් මෙරට නිර්මාණය කෙරී ඇති බැවිනි. මේ සමාජ තලය බිහි නොවන්නට, එනම් බිහි නොකරන්නට අමරදේව මහතා කොපමණ උත්සාහ කළ ද ඔහු ජනප්‍රිය නොවනු ඇත. මේ ප්‍රකාශය මෙසේ කිරීම එක් අතකින් නිවැරදි නොවේ. එයට හේතුව අමරදේව මහතා තනිව ම එවැනි උත්සාහයක් නොකළ බැවිනි. අමරදේව

© Prof. Nalin De Silva

මහතා ද අර සමාජ තලයට ම අයත් වූවෙකි. ඒ මහතා ද බිහි කරනු ලැබුයේ ඒ සමාජ තලය බිහිකළ පුද්ගලයන් ම විසිනි.

මේ ව්‍යාජ විද්ග්ධ සමාජ තලය දොරට වැඩියේ අවුරුදු හැත්තෑපහකට පමණ පෙර වුව ද එහි මුල් පාණ්ඩුරාවාදය දක්වා දිව යයි. මෙහි ඉතිහාසය විදූසර ලිපි පෙළට වඩා අදාළ වන්නේ දිවයින ඉරිදා සංග්‍රහයට ය. එබැවින් එය ඒ පුවත්පතේ සාකච්ඡා කිරීමට අදහස් කරමි. මෙහි දී කිව යුතු කරුණ නම් අමරදේව මහතාගේ ගීත සිංහල සංස්කෘතියෙහි වෙනසක් ඇති කිරීමට සමත් වී ඇති බව ය. එසේ වූයේ සවිඥානික ව කළ සමාජ සැත්කමක ප්‍රතිඵලයක් ලෙසිනි. සමාජ සැත්කම කළ පුද්ගලයන්ට අවශ්‍ය වූයේ ඊනියා විද්ග්ධ තලයක් සිංහල සමාජය තුළ බිහි කිරීමට ය. එහි දී ලංකා ගුවන් විදුලි සේවය ද උපයෝගී කර ගැනිණි. එහෙත් අවාසනාවකට බිහි වී ඇත්තේ ව්‍යාජ විද්ග්ධ සමාජ තලයකි. මේ තලයට අද ඊනියා ජනප්‍රිය සංස්කෘතිය පරාජය කිරීමට නොහැකි වී ඇත. සිරස හරහා පැමිණි මේ ඊනියා ජනප්‍රිය සංස්කෘතික රැල්ල අද ඊනියා විද්ග්ධ සංස්කෘතිය පරාජය කර ඇතිවා පමණක් නොව ලංකා ගුවන් විදුලි සේවය හා එහි අනුප්‍රාප්තික ඊනියා ජාතික රූපවාහිනිය ද ආක්‍රමණය කර ඇත.

මේ තත්ත්වය විශ්ව විද්‍යාල ක්ෂේත්‍රයේ ද දැක ගත හැකි ය. මේ සියල්ල සමාන්තර ව ගමන් කරයි. 1921 ආරම්භ කරන ලද විශ්ව විද්‍යාලීය ආයතනය (යුනිවර්සිටි කොලේජ්) ඔස්සේ සිංහල සමාජයට බිහි වී ඇත්තේ ව්‍යාජ විද්ග්ධ පිරිසකි. අද මේ පිරිස හා විශ්ව විද්‍යාල පද්ධතිය ම බටහිර රටවල උපාධි ලබාදෙන විවිධ ආයතන ඉදිරියේ පරාජය ලබමින් සිටියි. මෙය හුදෙක් ලෝක බැංකුවේ නියෝග මත සිදුවන්නක් නොවේ. ලංකා ගුවන් විදුලි සේවය සිරසට පරාජය වන්නේ ලෝක බැංකුවේ නියෝගයක් නිසා නොවේ. හුදු ආර්ථික කරුණුවලින් ඔබ්බට ගොස් මේ ප්‍රශ්න සාකච්ඡා කිරීමට වග බලා ගත යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva